**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**<u>කොළඹ</u>**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සාමාජීය මණ්ඩලයේ ඉහළ පෙළ සැසිය අමතයි.**

**ප්‍රතිසංස්කරණය වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයක් කේන්ද්‍ර කර ගත් ප්‍රතිසංස්කරණය වූ බහුපාර්ශවීයත්වයක අවශ්‍යතාවය පෙන්වා දෙයි.**

අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2020 ජූලි 17 වන දින නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සාමාජීය මණ්ඩලයේ (ECOSOC) ඉහළ පෙළ සැසිය අන්තර්ජාලය ඔස්සේ අමතන ලදී.

2021-22 වර්ෂය සඳහා ජූනි 17 වන දින ඉන්දියාව ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය නොවන සාමාජිකයකු ලෙස බහුතර ඡන්දයෙන් තේරී පත් වීමෙන් අනතුරුව අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා එක්සත් ජාතීන්ගේ පුළුල් සාමාජිකත්ව මණ්ඩලයක් ඇමතූ ප්‍රථම අවස්ථාව මෙය විය.

ECOSOC හි මෙවර තේමාව වූයේ, “කොවිඩ් 19 න් පසු බහුපාර්ශවීයත්වය: 75 වන සංවත්සරයේදී අපට අවශ්‍ය වන්නේ කවරාකාර එක්සත් ජාතීන්ගේ සංවිධානයක්ද?” යන්නයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමේ 75 වන සංවත්සරය යෙදෙන මෙම මොහොතේදී, මෙම තේමාව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ එළඹෙන සාමාජිකත්වය වෙනුවෙන් ඉන්දියාවේ ප්‍රමුඛත්වය සමඟද මනාව ගැලපේ. සමකාලීන ලෝකයේ යථාර්ථයන් පිළිඹිබු කෙරෙන පශ්චාත් කොවිඩ් සමයේ ප්‍රතිසංස්කරණය වූ බහුපාර්ශවීයත්වයක් සඳහා ඉන්දියාවේ කැපවීම අග්‍රාමාත්‍යතුමා මෙහිදී අවධාරණය කළේය.

ECOSOC සහ තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් ඇතුළු එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ කටයුතු හා ඉන්දියාව අතර පවතින දිගුකාලීන සම්බන්ධතාවය අග්‍රාමාත්‍යතුමා සිහිපත් කළේය. ඉන්දියාවේ සංවර්ධන ආදර්ශ පාඨය වන “සියලු දෙනාගේ විශ්වාසය සමඟින් සියලු දෙනාගේ සංවර්ධනය” යන්න තිරසාර සංවර්ධන අභිමතාර්ථයන්ගේ මුඛ්‍ය ප්‍රතිපත්තිය වන කිසිවෙකුත් අත නොහැරීම යන්න සමඟ සමපාත වන බව මෝදි මැතිතුමා සඳහන් කළේය.

සිය දැවැන්ත ජනගහනයේ සමාජ ආර්ථික නිර්ණායක ඉහළ නැංවීමෙහිලා ඉන්දියාව පෙන්නුම් කරන සාර්ථකත්වය ගෝලීය තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරන බව එතුමා පෙන්වා දුන්නේය. එසේම, අනෙකුත් සංවර්ධනය වන රටවල තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් ළඟා කරගැනීම සඳහා උපකාරී කිරීමට ඉන්දියාව දක්වන කැපවීමද එතුමා අවධාරණය කළේය.

සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් Swachh Bharat Abhiyan වැඩසටහන, කාන්තාවන් සවිබල ගැන්වීම, සැමට මූල්‍ය සේවා පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දීම හා Housing for All සහ Ayushman Bharat වැනි යෝජනාක්‍රම යටතේ නිවාස සහ සෞඛ්‍යසේවා පහසුකම් පුළුල් කිරීම ඇතුළු ඉන්දියාවේ දැනට ක්‍රියාත්මක සංවර්ධන ප්‍රයත්නයන් පිළිබඳවද එතුමා අදහස් දැක්වීය.

පාරිසරික තිරසාරභාවය සහ ජෛව විවිධත්වය සුරැකීම සඳහා ඉන්දියාව දක්වන උනන්දුවද අග්‍රාමාත්‍යතුමා පෙන්වා දුන්නේය. එසේම, ජාත්‍යන්තර සූර්යබල සන්ධානය සහ ආපදා ප්‍රත්‍යාස්ථ යටිතල පහසුකම් සඳහා වන එකතුව පිහිටුවීමෙහි ලා ඉන්දියාව දැක්වූ පුරෝගාමී දායකත්වයද මෝදි මැතිතුමා සිහිපත් කළේය.

කලාපය තුළ ඉක්මනින් ප්‍රතිචාර දක්වන්නකු වශයෙන් ඉන්දියාවේ භූමිකාව පිළිබඳව අදහස් දක්වමින් අග්‍රාමාත්‍යතුමා සිහිපත් කළේ ඉන්දීය රජය සහ ඖෂධ සමාගම් ලොව විවිධ රටවලට ඖෂධ සැපයීම සඳහා සහ සාක් රටවල් අතර ඒකාබද්ධ ප්‍රතිචාර ක්‍රමෝපායක් සම්බන්ධීකරණය කිරීම සඳහා සහයෝගය ලබා දුන් බවයි.

මෙය අග්‍රාමාත්‍යතුමා ECOSOC ඇමතූ දෙවන අවස්ථාව වේ. එතුමා 2016 ජනවාරි මාසයේදී ECOSOC හි 70 වන සංවත්සරයේදී එහි ප්‍රධාන දේශනය සිදු කළේය.

****

කොළඹ
ශක වර්ෂ 1942 අශද 30
2020 ජූලි 21